# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2092/13 - 2018 ඔක්තෝබර් මස 08 වැනි සඳුදා - 2018.10.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය:* එච්ඒකේ/එල්ඒඑන්/1/14.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:*43/9/2014/ඩබ්එස්/232.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, හක්මණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දබඩ පත්තුව නැගෙනහිර සුළු කොට්ඨාසයේ, අංක 294 උඩුපීල්ලගොඩ නැගෙනහිර ගමේ පිහිටි, මාතර දිස්ත්‍රික්කයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කර ඇති අවසාන ගම් පිඹුරු 497 හි පත්‍ර අංක 8 හි සඳහන් පහත විස්තර දැක්වෙන ඉඩම් කැබැල්ල.

01. **කැබලි අංක 137**

ඉඩමේ නම: දිවෙල, ගනේවත්ත, ඇල්ලලයකුඹුව; ඉඩමේ හිමියාගේ නම: විහාරාධිපති ශ්‍රී සුධර්මාරාම පුරාණ විහාරය උඩුපීල්ලගොඩ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0044.

*මායිම් :*

*උතුරට*: ඇළ සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); *නැගෙනහිරට*: කැබලි අංක 14, 4 සහ 13 ඒ; *දකුණට*: කැබලි අංක 13 ඒ සහ 4; *බටහිරට*: කැබලි අංක 4.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවළුන් හෝ 2018 නොවැම්බර් මස 12 වැනි දින පෙ.ව. 10.00 ට හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2018 නොවැම්බර් මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩමට/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
හක්මණ.

2018 ක් වූ ඔක්තෝබර් මස 03 වැනි දින,
හක්මණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 1253


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

1A - G 28680 - 17 (2018/10)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.